මගේ අංකය : JSC/SEC/CIR/2022

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,

<u>අධිකරණ කටයුතුවලට අදාලව පොලිස් නිලධාරීන්ගේ කාර්යභාරය විධිමත් කිරීම</u>

ශීර්ෂගත කරුණට අදාලව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - ලලිත් පතිනායක මහතා විසින් මා අමතා ඇති අංක S/DIG/C & E/OUT/598/2021 හා 2021.12.16 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපියෙහි සඳහන් කරුණු ඔබගේ අවධානයට යොමු කරන ලෙස මට නියම කර ඇත.

02. අදාල ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

වර්ෂ 2022 ජනවාරි මස 28 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

දුරකථන
தொலைபேசி
Telephone

ජ්‍යේ.නි.පො.ප./S/D.I.G. -2867303
පුද්ගලික සහකාර - 2867122

ෆැක්ස්
தொலைநகல
Fax

විද්‍යුත් තැපෑල
மின் அஞ்சல்
E - mail

Sdig.c&e@police.lk

මගේ අංකය
எனது இல.
My No
S/DIG/C& E/OUT/598/2021

ANNEXE A-

ඔබේ අංකය
உமது இல.
Your No

දිනය
திகதி
Date
2021.12.16

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රජා පොලිස් හා පාරිසරික කාර්යාලය
නො145,ප්‍රධාන විදිය, බත්තරමුල්ල.
OFFICE OF THE SENIOR DEPUTY INSPECTOR GENERAL OF POLICE
COMMIUNITY POLICING AND ENVIRONMENTAL

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
B. H.
10-25 A
17 DEC 2021

එච්.එස්.සෝමරත්න මහතා

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

<u>අධිකරණ කටයුතුවලට අදාළව පොලිස් නිළධාරින්ගේ කාර්යභාරය විධිමත් කිරිම</u>

පොලිස්පති විසින් මාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කර මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල නඩු කටයුතුවලට අදාළව ශ්‍රී ලංකා පොලිසියේ අඩුපාඩු නිරීක්ෂණය කොට ඒවා නිවැරදි කිරිම සඳහා ගතයුතු පියවර පිළිබඳ නිර්දේශ ලබාදෙන ලෙසට උපදෙස් ලබා දී ඇත.

තවද, මේ සම්බන්ධව ගරු මහාධිකරණ විනිසුරුවරුන් සහ ගරු මහේස්ත්‍රාත්වරුන් හමු වි අධිකරණ කටයුතුවලට අදාළව පොලිසියේ දුර්වලතා සහ නඩු මෙහෙයුම් කටයුතුවල පවතින ප්‍රමාදයන් මගහරවාලිමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබාගන්නා ලෙසත් වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.

මේ වනවිට දිවයින පුරා පිහිටි අධිකරණවලින් අහඹු ලෙස තෝරාගත් අධිකරණවලට නිළධාරි කණ්ඩායම් යොදවා ලඝු හා ලඝු නොවන නඩුවලට අදාළව පොලිස් නිළධාරින්ගේ රාජකාරි කටයුතු නිසිපරිදි ඉටු කරනවාද යන්න පිළිබඳව සහ ස්ථානාධිපතිවරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ අධිකරණවල කටයුතුවලට සහභාගිත්වය සම්බන්ධව කරුණු රැස් කිරිමට සැළසුම් කර ඇත. එමෙන්ම ජ්‍යෙෂ්ඨ පොලිස් නිළධරයන්, අහඹු ලෙස තෝරාගත් මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණවලට යොමු කර ගරු විනිසුරුවරුන් හමු වී සාකච්ඡා කිරිමට ද සැළසුම් කොට ඇත.

ඉහත කරුණු සම්බන්ධයෙන් අධිකරණ කොමිසම් සභාවේ අවධානය යොමුකර ගරු මහාධිකරණ විනිසුරුවරුන් හා ගරු මහේස්ත්‍රාත්වරුන් දැනුවත්කර අවශ්‍ය පහසුකම් සලසාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

16/12/21.

ලලිත් පතිනායක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
ප්‍රජා පොලිස් හා පාරිසරික

ලලිත් පතිනායක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ප්‍රජා පොලිස් හා පාරිසරික

පිටපත- ගොනුවට